# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය - හෝමාගම.

## අවසාන වාර පරීක්ෂණය - 2011

## ඉතිහාසය

## 1 පත්‍රය

**6 ශ්‍රේණිය** **කාලය - පැය 02 යි**

නම/විභාග අංකය :.........................................................................................................................

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01. මහමෙවුනා උයන කරවන ලද්දේ
    1. දේවානම්පියතිස්ස රජුය  2. මුටසීව රජුය
    3. දුටුගැමුණු රජුය  4. සද්ධාතිස්ස රජුය

02. අනුරාධපුර යුගයේ කෘෂිකර්මය ප්‍රධාන කොටස්
    1. 2 කි  2. 4කි
    3. 3 කි  4. 5 කි

03. මහසෙන් රජතුමාගේ රාජ්‍ය කාලය වූයේ
    1. ක්‍රි. ව. 276 -303  2. ක්‍රි. ව. 65 -109
    3. ක්‍රි. ව. 459 - 477  4. ක්‍රි. ව. 575ී 608

04. පදවිය වැඩ කරවන ලද්දේ
    1. දෙවෙනි මුගලන් රජු  2. අග්බෝ රජු
    3. ධාතුසේන රජු  4. වසභ රජු

05. දුටුගැමුණු රජු සටනට පිටත් වූයේ
    1. මහියංගනයේ සිටය  2. මාගම සිටය
    3. මන්නාරම සිටය  4. අනුරාධපුර සිටය

06. දුටුගැමුණු රජු පළමු සටන සිදු කරන ලද්දේ
    1. මහියංගනයේදී  2. කසා පබ්බතයේදී
    3. විජිත පුරේදී  4. කුලත්තවාසියේදී

07. වැවක අතිරික්ත ජලය පිටට ගලා යෑමට ඉඩ සලසා ඇති විවරය
    1. සලපනාවයි  2. පිටවානයි
    3. ඇතුළුවානයි  4. සොරොව්ව

08. වැවක ජලය බෙදාහැරීමට සකස් කළ විවරය

1. සොරොව්වයි  2. පිටවානයි

3. සලපනාවයි  4. බිසෝකොටුවයි

09. මින්නේරි දෙවියන් ලෙස දේවත්වයෙන් පිදුම් ලබන්නේ

1. මහසෙන් රජුය  2. ධාතුසේන රජුය

3. මුගලන් රජුය  4. අග්බෝ  රජුය

10. දුටුගැමුණු රජු විසින් කර වූ වෙහෙර විහාර සංඛ්‍යාව

1. 89 කි  2. 98 කි

3. 72 කි  4. 65 කි

11. වසභ නම් ගැමි නායකයාගේ පුතා

1. වේළුසුමනයි  2. නන්දිමිත්‍රයි

3. ථේරපුත්තාභයි  4. භරණයි

12. එළාර රජු අනුරාධපුරයේ රාජ්‍ය බලය ලබා ගත්තේ

1. අසේල රජු මැරීමෙනි  2. සූරතිස්ස රජු මැරීමෙනි

3. උත්තිය රජු මැරීමෙනි  4. තිස්ස රජු මැරීමෙනි

13. මල්වතු ඔය ගඟ අසබඩ පිහිටි ගමකි.

1. උපතිස්ස ගාම  2. දීඝවාපී

3. විජිත ගාම  4. උරුවෙලාගාම

14. රෝහණ රාජ්‍යයේ පාලන මධ්‍යස්ථානය වූයේ

1. ගිරිදේශයයි  2. සේරුනුවරයි

3. මාගමයි  4. කැලණියයි

15. ජය ශ්‍රී මහ බෝධිය රෝපණය කරවූයේ

1. මහමෙවුනාවේය  2. මිහින්තලාවේය

3. මහියංගනයේය  4. දඹදිවය

16. මහින්දාගමනය සිදුවූයේ

1. බු. වු. 236 දී  2. බු. ව. 326 දී

3. බු. ව. 502 දී  4. බු.ව. 636 දී

17. පණ්ඩුකාභය කුමරුගේ පුරෝහිත වූයේ

1. පණ්ඩුල බ්‍රාහ්මණයා  2. චන්ද්‍ර කුමරු

3. අභය කුමරු  4. ගිරිබන්ඩශිව කුමරු

18. පඬුවස්දෙව් රජුගෙ පියා වූයේ

1. සුමිත්ත කුමරුය 2. විජය කුමරු
3. ගෝඨාභය කුමරුය 4.සාලිය කුමරුය

19. "අතීත සිද්ධීන් පිළිබඳ දැනුම වනාහී මනුෂ්‍ය ස්වභාවය නිවැරදි කිරීම සඳහා ප්‍රබලතම උපකරණය වෙයි" මෙසේ ප්‍රකාශ කළේ

1. පොලිබියස් 2. ඩියඩෝරස්
3. හෙරඩෝටස් 4. E.H. කාර්

20. ඉන්දියාවේ තාමුලිප්ති වරායෙන් නැව්නැග ලංකාවේ ත්‍රිකුණාමලයට ගොඩබට ආර්ය පිරිස වූයේ

1. භද්ද කච්චාන ඇතුළු පිරිසයි 2. පඬුවස්දෙව් කුමරු ඇතුළු පිරිසයි
3. විජායි කුමරි ඇතුළු පිරිසයි 4. අමිතෝදන ශාක්‍ය රජුය

# *ඉතිහාසය II පත්‍රය*

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

1. සපයා ඇති අනුරාධපුර නගර සීමාව දක්වන සිතියමේ පහත ස්ථාන ලකුණු කරන්න.

1. අබයගිරි දාගැබ 6. ශ්‍රී මහා බෝධිය
2. ථූපාරාම දැගැබ 7. දක්ඛිණ ථූපය
3. ජේතවන දැගැබ 8. මිරිසවැටි දාගැබ
4. මහා ථූපය 9. අභය වැව
5. මහමෙවුනා උයන 10. ලංකාරාමය

( ලකුණු 2 x 10 = 20 )

2.

I. අනුරාධපුර යුගයේ රජ කළ පඬුවස්දෙව් රජතුමාගේ මුණුබුරා කවුද ? ( ල. 01 )
II. එම රජතුමා ඉදිකළ වැව් 03 ක් සඳහන් කරන්න. ( ල. 03 )
III. එතුමා අනුරාධපුර නගරය කේන්ද්‍ර කොටගෙන ක්‍රමවත් පාලනයක් ගෙන ගිය අයුරු විස්තර කරන්න ( ල. 6 )

3. ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීම පිළිබඳ ඓතිහාසික සිද්ධියේදී දේවානම්පියතිස්ස රජතුමා හා අශෝක අධිරාජ්‍යයා අතර තිබූ දැඩි මිත්‍රත්වය කැපී පෙනෙයි.

I. අශෝක අධිරාජ්‍යයා කිනම් රටක රජ කෙනෙක් ද ? ( ල. 01 )
II. අශෝක අධිරාජ්‍යයා සහ දේවානම්පියතිස්ස රජු අතර මිතු දමක් පැවති බවට උදාහරණ 03 ක් දෙන්න ( ල. 03)
III. බුදු දහම ලැබීමෙන් පසු ශ්‍රී ලාංකික ජන ජීවිතයේ සිදු වූ සංවර්ධනය විස්තර කරන්න.( ල. 06 )

4. දඩයම් එඬේර හා ගොවි යුග පිළබඳ ව අධ්‍යයනය කිරීමෙන් මානව ශිෂ්ටාචාරයේ ප්‍රභවය හා විකාශය ක්‍රමික ව සිදු වූවක් බව පැහැදිලිවේ.

I. එඬේර යුගයේ මිනිසාගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූයේ කුමක් ද ? ( ල. 01)

II. දඩයම් යුගයේ මිනිසාගේ ඇදහිලි හා විශ්වාස ක්‍රම 03 ක් ලියන්න ( ල. 03)

III. දඩයම්, එඬේර හා ගොවි යුග ඇසුරින් පහත වගුව පුරවන්න.

| යුගය | භාවිත කළ මෙවලම් | ලබා ගත් ප්‍රයෝජන |
|---|---|---|
| දඩයම් | | |
| එඬේර | | |
| ගොවි | | |

5. කෘෂිකාර්මික රටක ජීවනාලිය එරට වැව් පද්ධතිය යි.

I. "වැව් බැඳි රාජ්‍යය" ලෙස හඳුන්වන්නේ ලංකාවේ කුමන ප්‍රදේශයද ? ( ල. 01)

II. වැවක් ඉදිකිරීමට භූමිය උපයෝගී කර ගත්තේ කෙසේද ? ( ල. 02)

III. වැවක රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න. ( ල. 07)

6. වර්ෂා ජලයෙන් කෘෂිකාර්මික ජීවන රටාවකට හුරු වූ ජනයා පසුව ගම් ප්‍රධානීන් ගේ මූලිකත්වයෙන් "ගම් වැව්" නිර්මාණය කළහ.

I. පසු කාලීනව මධ්‍යම හා විශාල පරිමාණ වැව් නිර්මාණය කිරීමට පෙළඹුණෝ ඇයි? හේතු 02 ක් ලියන්න ( ල. 02)

II. වසභ, ධාතුසේන හා මහසෙන් යන රජවරු ඉදිකළ වැව්දෙක බැගින් ලියන්න. ( ල. 03)

III. අනුරාධපුර යුගයේ ජීවත් වූ ජනතාව ගොඩ ගොවිතැනින් ජීවිත සරු කරගත් ආකාරය පිළිබඳ කරුණු 04 ක් ලියන්න. ( ල. 05)